01. පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01

02. ලේකම්
මහජන ආරක්ෂක අමාත්‍යාංශය
14 වන මහළ
සුහුරුපාය
බත්තරමුල්ල

<u>මුදල් ගණුදෙනුවක් අදාළ, ''ඊනියා'' ගිවිසුමක් මුල් කරගෙන, අත්අඩංගුවට ගන්නා බවට කරනු ලබන තර්ජන වළක්වාලන ලෙසට කරනු ලබන ඉල්ලීම.</u>

ගිගිරිවලගේ ඉන්දුම උපශාන්ත පෙරේරා, අවු: 53 යි, ජා.හැ.අ. 701672526 V, අවිවාහක, රැකියාව: රියදුරු, ලිපිනය: 31, රතු කුරුස නිවාස, කිතුලාව, කළුතර දකුණ. දු.අ. 070 1383777

2024.02.02 වන දින දීය.

2024.01.25 වන දින, රාත්‍රී 11.00 ට පමණ, මා, ගෙදර නිදාගෙන සිටියදී, ඥාති පුත්‍රයෙකු පැමිණ, අසල පදිංචි මාගේ නංගී වන ලක්මිනි පෙරේරාගේ ගෙදරට, පොලීසියෙන් ඇවිත් ඉන්නවා කියා, මාව එක්කගෙන ගියා.

මා යන විට, පානදුර විශේෂ විමර්ශන අංශයේ නිලධාරීන් තුන් දෙනෙකේ හිටියා. එහි සිටි දයාල් තුණ්ඩුවක් දී, 2024 ජනවාරි 20, පානදුර පොලිස් අධිකාරී කාර්යාලයේ පිහිටි, පානදුර විශේෂ විමර්ශන අංශයට එන ලෙසට ඔවුන් කියා සිටියා. සාක්ෂියට අත්සන් කරන ලද, මාගේ බෑනා කෙනෙකු වන, ශක්ති අවිඳු සම්බන්ධ ගිවිසුම ගැන, ප්‍රකාශයක් ගන්න බව.

ඒ අනුව මා, 2024 ජනවාරි 20, නියමිත වේලාවට පානදුර විශේෂ විමර්ශන අංශයට ගොස් ඉදිරිපත් වුනා.

එම ස්ථානයේ, ස්ථානාධිපතිවරයා, මාගෙන්, මාගේ බෑනා වන, ශක්ති අවිඳු, ලක්ෂාන් නැමැත්තා සමග ඇති කරගත් මුදල් ගණුදෙනුවක් අදාළ ''ගිවිසුමකට'' පළමු සාක්ෂිකරු වශයෙන්, නීතිඥ මහත්මියක් ඉදිරිපිටදී, අත්සන් කරනු ලැබුවාද යන්න විමසා සිටියා. මා පිළිගත්තා, එම නීතිඥවරිය, මාගෙන්, ශක්ති අවිඳුව, අඳුරනවාද කියා විමසා සිටියා. එවිට, මා, ශක්ති අවිඳු මාගේ නැගිණියගේ පුතා බව, ඇයට කියා සිටියා.

ඒ අනුව, පෙන්වා දුන් ස්ථානයේ, මා අත්සන් කළ බවද, ස්ථානාධිපතිවරයාට කියා සිටියා.

මා, මාගේ බෑනා වන, ශක්ති අවිඳුව දන්නා අඳුරන බවට හා එවක පදිංචි ස්ථානය දන්නා බවට අත්සන් කළ බවද කියා සිටියා.

මෙම ස්ථානාධිපතිවරයා, මාගේ බෑනාව, සති 02 ක් තුළ, ගෙනවිත් බාර නොදුන්නොත්, (ශක්ති අවිඳු - බෑනාව) සඟවා සිටීමට, ආධාර අනුබල දීම යන චෝදනාව යටතේ, රිමාන්ඩ් කරන බවට තර්ජනය කරනු ලැබුවා.

මා, මාගේ බෑනා වන ශක්ති අවිඳු දන්නා අඳුරන බවට කරන ලද අත්සන මුල් කරගෙන, ඊනියා ''ගිවිසුමක්'' පෙන්වමින් අත්අඩංගුවට ගැනීම සිදු නොකරන ලෙසට ඉල්ලා සිටිමි.

ඔබගේ දැන ගැනීම සඳහා, ලියාපදිංචි කර නොමැති, අගමුල නොමැති, ගිවිසුමේ ඡායාස්ථ පිටපත ඉදිරිපත් කරමි.

මෙයට,
Sandamonoth
ගිගිරිවලගේ ඉන්දුම උපශාන්ත පෙරේරා
2024/02/02.